## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්‍මේන්තුව

### දෙසැම්බර් 04 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළඟපොළ විද්‍යාලය

**<u>පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.</u>**

1. පොදු ස්ථාන ආරක්ෂා කරගැනීමට අපට කළ හැකි දේවල් තුනක් කියන්න.
2. බුදු හාමුදුරුවො අපිත් දකින්නැති ගීතය ගාය නා කරන්න.
3. **යේ ධම්මා හේතුප්පභවා** යන ගාථාව කියන්න.
4. භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමට මහ ප්‍රජපතී ගෝතමී දේවිය කැප වූ ආකාරය පවුලේ අයට කියා දෙන්න.
5. වණ්ණුපථ ජාතකය වැඩිහිටියන්ගෙන් අසා මතකයෙන් කියන්න.
6. **යං නම්මදාය නදියා** යන ගාථාව කියන්න.
7. සොළොස්මස්ථාන වඳින ගාතාව වැඩිහිටියන්ගෙන් අසා මතකයෙන් කියන්න.
8. **කිරි සුදු පැහැයෙන් බැබලෙන්නේ** යන කවිය කියන්න.
9. **සඳ රැස් දහරින් නැහැවෙන්නේ** යන කවිය කියන්න.
10. බුදුසමිඳුගෙ පිහිට ලැබූ පූතිගත්ත තිස්ස තෙරිඳු යන පාඩමේ ඇති කවි පන්තිය විරිඳු ශෛලයෙන් ගායනා කරන්න.

**<u>දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,</u>**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. තිස්ස තෙරුන්ට බුදු හිමි සියතින්ම උවටැන් කළේ ය. (   )
2. බුදුහිමිගේ නුවණ නිසා කිසාගෝතමියගේ සිත සුවපත් විය. (   )
3. සෑ මළුව,බෝ මළුව හා විහාර ගෙය යනු ත්‍රිවිධ රත්නය යි. (   )
4. සංඝමිත්තා මහ රහත් තෙරණිය මෙරට ජය ශ්‍රී මහ බෝධිය වැඩම කළහ. (   )
5. මැදුම් පිළිවෙත යනු සිරුරට දැඩි සේ දුක දීමයි. (   )

- අසරණයන්ට පිහිට වීම යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.



සෑම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !